# කැලෑ යාලුවෝ



නෙතලි විහන්සා ජයරත්න

# කැලෑ යාලුවෝ

© නෙතුලි බිහන්සා ජයරත්න

## කතෘගේ වෙනත් කෘති

- අකීකරු පසිඳු,
- බිංදුට පාඩමක්,
- පූංචි මලිති

සියලුම හිමිකම් ඇවිරිණි.

ප්‍රථම මුද්‍රණය - 2024
ISBN - 978-624-208-374-2

කතාව හා චිත්‍ර
නෙතුලි බිහන්සා ජයරත්න
6 ශ්‍රේණිය
මහාමායා බාලිකා විදුහල - මහනුවර

# පිදුම

ග්‍රන්ථ රචනාකරණයට මා දිරිමත් කළ

ආදරණීය දෙමාපියන්ට,

පවුලේ සියලු දෙනාට හා

ආදරණීය ගුරු මෑණිවරුන්ට හා පියවරුන්ට ........

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපීපෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනඟා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත් වීම සුවිශේෂී සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භිකෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.


මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණය ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛණකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,

ශෂිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර.

ඔන්න එකෝමත් එක රටක ලොකු කැලෑවක් තිබුණා. මේ කැලෑවේ ගස් වැල්වල මල් පිරිලා. නිල් පාට පැහැදිලි ජලය පිරුණු ගංගා ඇළ දොළවල මාළුවෝ හරි සතුටින් පීන පීන හිටියා.



මේ කැලෑවේ සත්තුන්ට ඇති තරම් කෑම බීම තිබුණා. ඒ නිසා සත්තු හරිම සතුටින් සමගියෙන් ජීවත් වුණා.



ටික කාලයක් යනකොට මේ කැලෑවට නියඟයක් උදා වුණා. ගස් මැරිලා ගියා. ජල උල්පත් සිඳී ගියා.



සත්තුන්ට කන්න එළවළු, පලතුරු නැති වුණා. බොන්න වතුර නැති වුණා. මේ ගැන කතා කරන්න කැලෑ සභාව රැස් කළා.




“අපි මේ නියඟයට මොකද කරන්නේ?”

අලි රාළ ඇහුවා.

“අපි මේ කැලය දාලා එහා කැලයට යමු.”

කූඹිච්චි කිව්වා.



එතකොට කලබල වුණු වලස් හාමි මෙහෙම කිව්වා.

"ඒක කරන්න බෑ. අපි මේ කැලේ තමයි පුංචි කාලේ ඉඳලම හැදුනේ. මම නම් කැමති නෑ මේ කැලය දාලා කොහේවත් යන්න."



“එහෙනම් අපි මොකද කරන්නේ?”

වඳුරු පුංචා ඇහුවා.

“අපි එහෙනම් මේ කැලයේ ආයෙත් ගස් හිටවමු.”

අලි රාළ කිව්වා.



හැමෝම ඒ තීරණයට කැමති වුණා. යාළුවෝ ටික වැඩ පටන් ගත්තා. කුරුලු යාළුවෝ ඇට වර්ග හොයාගෙන එන්න එහා කැලයට ගියා. වඳුරු හාමිලත් වතුර ගේන්න එහා කැලයට ගියා.



හා පැංචලා, ඌරු පැංචලා බිම වළවල් හැරුවා. කැලෑ යාළුවෝ ඔක්කොම එකතු වෙලා ඇට හිටෙව්වා. අලි රාළ තමන්ගේ හොඬෙන් පැළවලට වතුර ඉස්සා. හැමෝම හරිම උනන්දුවෙන් වැඩ කළා.



ඊට පස්සේ හැමෝම හැම දවසකම පැළවලට වතුර, පොහොර දලා සාත්තු කළා.



ටික දවසක් යනකොට පැළ ලොකු වෙලා ගස් හැදුණා. ඒවායේ එළවළු, පලතුරු හැදුණා. නියඟය නැති වෙලා ගියා. ඊට පස්සේ හැමෝම සතුටින් ජීවත් වුණා.

## නිමි.

**ආදර්ශය**

**සමඟියෙන් වැඩ කිරීමෙන් ඕනෑම අභියෝගයක් ජයගත හැකිවේ.**



# කැලෑ යාලුවෝ

පසුවදන

## නෙතලි ධිහන්සා ජයරත්න



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමඟ දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතුවී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වේ. මීට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනවිරත්න මහලේකම්

ISBN - 978-624-208-374-2

©කතෘ